# ජපන් බිමෙහි විශ්‍රාන්තිය විඳි ලාංකීය හදක්

එන් .ටී .ජයසුන්දර

සිංහල සාහිත්‍ය කලාවට නොනිමි මෙහෙවරක් කළ එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මළගිය ඇත්තෝ සමඟ විශ්‍රාන්තිය සොයා දියත් කෙරෙන චාරිකාවක පද ගෙතුමේ ඇරඹුමයි. ලාංකීය කඩවසම් තරුණයෙකු වන දෙවෙන්දොරා සං හට ජපන් තරුණියක වන නොරිකෝ සං ගේ හමුවීම අරඹයා ගොඩ නැගෙන මළගිය ඇත්තෝ අපූර්වතම රසෝත්පාදනයකින් යුතුව ජපන් සංස්කෘතිය මඟින් ආදරණීය වේදනාබර බැඳීමක් ඇතිව දිග හැරෙයි .එහි වූ විශ්‍රාන්තිය රසික සිත් නොදැකපු එතෙරක අතරමං කර නැවත ලත් තැනම ලොප් කරන්නේය.

"ගිනි පෙට්ටි,තේ කෝප්ප වැනි තමා පාවිච්චි කරන සෑම දෙයකට අපුර්ව හැඩයක් දමා විචිත්‍ර වර්ණයක් කවා.....සීරුවට සිත්තම් කරන මෙම රටා තුළින් මනුෂ්‍ය ඉන්ද්‍රියන් පිබිදේ."ඒකී සුන්දරත්වය විඳින්නට අව්‍යාජ හදකට මිස අරුමෝසම් ජීවිතවලට නොහැක්කේය. අප්‍රාණිකත්වය ද හැඩයක් කර ගැනුම අවිවේකී ජීවිතයට ඔසුවක්ම වන්නේය."විසිතුරු පරිසරයකින් සාදන ලද කෝපි ශාලාවල අඩ එළියෙහි වාඩි වී සංගීතයට කන් දුන්නෙමි.කෝපි උගුර උගුර බොමින් කාලය ගත කිරීමෙන් මම මහත් විවේක සුවයක් වින්දෙමි." තනිකම ,සතුට,දුක සියල්ල එක්ව බැඳි පාලමක් කොට ගන්නට හැකි විය.එය ජීවිතය දකින ඔහුට දැනෙන්නේ ඔබට මට දැනෙන කෝණයකින්ම දැයි සිත විමසන්නේය. "කොතනත් හම්බ වෙන්නේ අමුතු අමුතු විදියේ ගිනි පෙට්ටිනේ ....යන කොට මේක මට දෙනවද?" කෝපි බොන්නට යන දෙවෙන්දොරා සං එහි දී දකින නානා විධ වු ගිනි පෙට්ටි එකතු කිරීම පුරුද්දක් කර ගත්තේය.ඒ එහි වු වෙනස් රටා ඔහු සිත් ආකර්ෂණය කොට ගත් නිසාවෙනි.අන් පිරිමින් හා සසඳන කල්හි ඔහු තුළ ඇති ඒ රසාලිප්ත බව නොරිකෝ සං ද මවිත කරන්නේ ය.ළතෙත් බව ආවේණික කොට ගත් හද සුන්දරත්වය විඳින්නේ ඒ නිසාම යැයි දැනෙන්නේ ය.

"නෝ නාට්‍ය බැලීමි. ගේෂා නැටුම් නැරඹුයෙමි. කබුකි බැලීමෙන් තරම් තියුණු රසාස්වාදයක් මා කොතැනක වත් ලබා නැතැයි මම සිතමි."දෙවෙන්දොරා සහ නොරිකො නාට්‍ය බලමින් සැහැල්ලුවක් එක් කර ගන්නේ ද නැවත නැවතත් රස උද්දීපනය සොයා පිය නගන්නේ ද අපූර්වතම බව මෙන්ම දෙදෙනාගේම සිත විසීරී පවතින නිසාමය ,එය ඔවුනට මහමෙරකි."පංචිකො සෙල්ලම් කර..."තෝකියෝවට සුවිශේෂි වූ ක්‍රීඩාවක් වන මෙය 'හිට් ඒ පින් ' නම් ක්‍රීඩාවට සමානය.එහි සෑම වීදියකම පාහේ පංචිකො ක්‍රීඩා හලක් දක්නට ලැබේ."සුෂි හලක කෑම අනුභව කිරීමෙන් මා ලබන්නේ කිසි කලක නොලත් විරූ ආස්වාදයකි." තිත්ත නොවූ ආස්වාදය, අලුත් අත්දැකීම් සිත්පිත් ළතෙත් කරන්නේය.එයම සතුට යැයි දැනෙන්නේමය. පෙම්වත් කතාවලට ඇරයුමක් ගෙන දෙමින් දින ගත වන්නේ ජීවිතය සොයමින් යන දෙදෙනෙකුගේමය එය සුන්දර ජීවිත ගමනකි,විශ්‍රාන්තිය මුසු වුවකි.

"අපි කඩ වීදි දිගේ ඇවිදිමින්... වීදුරු පලු අස්සෙන් පෙනෙන විසිතුරු බඩු දෙස බලා ඒවායේ මිල ගැන කතාබස් කර...වෙළෙඳ හල්වලට පිවිසියෙමු."පෙම්වතුන්ගේ ලෝකය එතුළ ඇති නිදහස ඊට පිළිතුරු සොයන අන්දම ජපානයට පමණක් පොදු වුවක් නොවේ යැයි හැඟේ."දිය තිබුණු සමහර තැන්වල තරුණ තරුණියෝ ඔරු පදිති."ඔවුහු ජීවිතයේ හිරිමල් සමය අපූරු ලෙස විඳින්නේය.එය අද වටිනාකම්වලින් සපිරි පරාසයක් දක්වා විහිදී පවතින්නේ ඉල්ලුම් සැපයුම් න්‍යාය තුලනය කරමිනි.සදෙසෙන් එළිය ලැබූ ලිපිය දෙවෙන්දොරා හා නොරිකෝ හට අදහස් හුවමාරුවට අපූරු මෙවලමක් වූවා මෙන්ම නැවත නැවතත් ඒවා කියවමින් ස්මරණ චාරිකාවක නිමග් නැතිව සැරිසැරීය.එතුළ විඳින චමත්කාරය වචනවලට රාමු කොට තැබිය නොහැක්කේ ය. "ඒ ඒ රටවල තිබෙන තාන්ත්‍රික චිත්‍ර කලාව මැනවින් පුහුණු කළෙමි.""ලී කැටයම් කපා සිතුවම් අච්චු ගැසීමේ කලාව හොඳින් පුහුණු වීමට සාමාන්‍යයෙන් බොහෝ කාලක් ගතවන නමුදු හය හත් මසකින් මම සෑහෙන ප්‍රමාණයක කෞශල්‍යයක් ලබා ගත්තෙමි."දෙවෙන්දොරා සං හට කලාකාමීත්වය පසෙකලා ජීවත් වීමට නොහැකි තරමටම අවියෝජනීය බැඳිමක් ඔහු තුළ විය.සිත්තමට ,කැටයමට ,ගීතයට ආශක්ත වූ ඔහු ජිවිතයේ නොයෙකුත් මංසන්ධියන්හි දී නිදහසේ ගලා යන්නට ඉඩහසර වෙන් කරන ලද්දේ එනිසාවෙනි.

කල්පිතය මෙන්ම සත්‍යයත් අතර පෙදෙස මනාව හඳුනාගත් නිර්මාණයක් වන මෙහි ක්‍රීඩාව හා විශ්‍රාන්තිය පාඨකයාට සමීප කිරීම අදහස නොවන්නේ වුවද එතුළ එය සුලලිතව විස්තර වන්නේය.

එදිරිවීර සරච්චන්ද්‍ර(1959) මළගිය ඇත්තෝ, සරච්චන්ද්‍ර ප්‍රකාශන, අංක 48/41 ඒ, එපිටමුල්ල පාර පිටකෝට්ටේ.